# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1997/41 - 2016 දෙසැම්බර් මස 16 වැනි සිකුරාදා - 2016.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය :* නුඑ/3/1/2/අත්පත්/111/51.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4/3/12/2013/CEB/22.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළයේ සුළු කොට්ඨාසයේ, තලවකැලේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක. මූ.පි.නු 3057 හා 2016.09.06 වැනි දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 සිට 8 ලෙස පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.9250 ක් පමණ වන ඉඩම් කොටස්:

01. කැබලි අංක 01
ඉඩමේ නම: ලෝගි වත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩු බිම්; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0005.

02. කැබලි අංක 02
ඉඩමේ නම: ලෝගි වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: සී/ස තලවාකැලේ වැවිලි සමාගම, අංක 25, ෆෝස්ටර් පටුමග, කොළඹ 10; ප්‍රමාණය: හෙක්. 0.0135.

03. කැබලි අංක 03
ඉඩමේ නම: ලෝගි වත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0063.

04. කැබලි අංක 04
ඉඩමේ නම: ලෝගි වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0482

05. කැබලි අංක 05
ඉඩමේ නම: ලෝගි වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 15ක්, තාවකාලික ගොඩනැගිල්ලක්, ස්ථිර ගොඩනැගිලි දෙකක කොටසක්, තාවකාලික ගොඩනැගිල්ලක කොටසක්, සහ වතුර ටැංකියක් ඇත; හිමිකම් කියන අය: සී/ස තලවාකැලේ වැවිලි සමාගම, අංක 25, ෆෝස්ටර් පටුමග, කොළඹ 10; ප්‍රමාණය: හෙක්. 0.8056.

06. කැබලි අංක 06
ඉඩමේ නම: ලෝගි වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ ස්ථිර

ගොඩනැගිලි හතරක කොටසක්; හිමිකම් කියන අය: සී/ස තලවාකැලේ වැවිලි සමාගම, අංක 25, ෆෝස්ටර් පටුමග, කොළඹ 10; ප්‍රමාණය: හෙක්. 0.0442.

07. **කැබලි අංක 07**
ඉඩමේ නම: ලෝගි වත්ත; ඉඩමේ විස්තරය: ලඳු කැලය; හිමිකම් කියන අය: සී/ස තලවාකැලේ වැවිලි සමාගම, අංක 25, ෆෝස්ටර් පටුමග, කොළඹ 10; ප්‍රමාණය: හෙක්. 0.0442.

08. **කැබලි අංක 08**
ඉඩමේ නම: ලෝගි වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: සී/ස තලවකැලේ වැවිලි සමාගම, අංක 25, ෆෝස්ටර් පටුමග, කොළඹ 10; ප්‍රමාණය: හෙක්. 0.0033.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් 2017 ජනවාරි මස 10 වැනි දින පෙ.ව. 10.30 ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සම්මුඛ විය යුතුය.

තව ද, 2016.12.28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්.පී.කේ.බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2016 දෙසැම්බර් මස 14 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-1308

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.